# සමාගම් නීතිය

සමාගමක් යනු කුමක්ද යන්න 2007 සමාගම් පනත තුල අර්ථකථනය කර නැත.

නඩු තීන්දු සහ පාඨ ග්‍රන්ථ අනුව සමාගමක් යනු, ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා පුද්ගලයන් විසින් ඇති කර ගනු ලැබූ නෛතික පුද්ගලභාවයක්,සීමිත වගකීමක් සහ අඛණ්ඩ පැවැත්මක් ඇති ව්‍යාපාර ඒකකයකි. ඒ අනුව

## සමාගමක මූලික ලක්ෂණ

- වෙන්වූ නෛතික පුද්ගලභාවය
- අවිච්ඡින්න පැවැත්ම හෙවත් නිත්‍ය සන්තතික හැකියාව
- සීමිත වගකීම
- කොටස් නිදහසේ පැවරිය හැකි වීම

1) වෙන්වූ නෛතික පුද්ගලභාවය

සමාගමක් යනු , එහි අයිතිකරුවන්ගෙන් සේවකයන්ගෙන් සහ අධ්‍යක්ෂකවරුන්ගෙන් වෙන්වූ වෙනම නෛතික ඒකකයකි. **Paulcoir ( pvt ) Ltd Vs. Vass** නඩුවේදී තීරණය වූයේ ස්වභාවික තැනැත්තන් සහ, සමාගමක් අතර ඇති එකම වෙනස වන්නේ “සමාගමකට ඇටකටු, ඇටමිදුලු, මස් නොමැති නෛතික වස්තුවක් වීම පමණි”.

සමාගමක නෛතික පුද්ගලභාවය සම්බන්ධයෙන් පහත නඩු තීන්දු වැදගත්ය.

**Salmon Vs. Salmon and Co. Ltd**

**Macaura Vs. Nothern Assurance** - මෙහිදී මැකව්රා යන අය විසින් පවත්වා ගෙන ගිය දැව ව්‍යාපාරය සඳහා ඔහු විසින් ඔහුගේ නමින් රක්ෂණාවරණයක් ලබා ගෙන තිබුණි. පසුවම එම ව්‍යාපාරය සමාගමක් බවට පරිවර්තනය කර එම දැව තොගය, නව සමාගමට විකිණීය.

පසුව ඇතිවූ ගින්නකින් එම දැව තොගය විනාශ වී ගිය අතර රක්ෂණ වන්දි ඉල්ලා පැවරූ මෙම නඩුවේදී අධිකරණය තීරණය කලේ එලෙස වන්දි ලබා ගැනීමේ අයිතියක් මැකව්රා ට නොමැති බවයි. ඊට හේතුව වූයේ දැව වලට හානි වන අවස්ථාවේදී එම දැව වල අයිතිය මැකව්රා සතුව නොමැති වීමයි.

**ට්‍රේඩ් එක්ස්චේන්ජ් ( සිලෝන් ) ලිමිටඩ් එ. ඒෂියන් හොටේල්ස් කෝපරේෂන්** - මෙහි ඒෂියන් හොටේල්ස් කෝපරේෂන් හි කොටස් වලින් 95% ක්ම රජය සතු විය. එලෙස රජය විසින් කොටස් හිමිකාරීත්වය දැරූ පමණින් හෝටල් සමාගම රජයේ නියෝජිත ආයතනයක් නොවන බවත්, හෝටල් සමාගමට එරෙහිව රිට් ආඥාවක් ලබාගත් නොහැකි බවත් මෙබ නඩුවේදී තීරනය විය.

**DFCC බැන්ක් එ. මුදිත පෙරේරා** හිදී තීරණය වූයේ සමාගමක ණයක් වෙනුවෙන් ඇපයට තබන ලද අධ්‍යක්ෂකවරුන්ගේ දේපල සම්බන්ධයෙන් පරාටේ බලතල ක්‍රියාත්මක කල නොහැකි බවයි.

මෙලෙස සමාගමක නෛතික පුද්ගලබාවය නැමැති සංකල්පය භාවිතා කරමින් විවිධ නීතිවිරෝධී සහ වංචනික ක්‍රියා සිදුවීමේ ඉඩකඩක් පවතින නිසා එම සංකල්පය නොසලකා සමාගමක ක්‍රියාවක් සම්බන්ධයෙන් එහි සාමාජිකයන් වෙත වගකීම පවරන අවස්ථා අපගේ නීති පද්ධතිය තුල දක්නට ඇත. මෙය සමාගමක සංස්ථාපිත කඩතුරාව ඉවත් කිරීම / සාංගමික කඩතුරාව ඉවත් කිරීම ලෙස හැඳින්වේ.

## <u>සාංගමික කඩතුරාව ඉවත් කිරීමට සිදු වන අවස්ථා</u>

- සාංගමික කඩතුරාව භාවිතා කරමින් වංචාවක් සිදු කොට ඇති අවස්ථාවකදී
- ජාතික හදිසි අවස්ථාවකදී
- බදු ගෙවීම පැහැර හැරීමකදී
- වස්තු භංගත්වය පිලිබඳ අධ්‍යක්ෂකවරුන් සතු යුතුකම කඩකල අවස්ථාවකදී
- සමූහ මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අධ්‍යක්ෂකවරුන් සතු යුතුකම කඩකල අවස්ථාවකදී
- සමාගම වගකීමට ලක්කරන ලේඛණ අඩුපාඩු සහිතව සකස් කර ඇති අවස්ථාවකදී

2) අවිච්ඡින්න පැවැත්ම

සමාගමක කොටස් හිමියෙකුගේ මරණය, සිහිවිකලත්වය, වස්තු භංගත්වයට පත්වීම, පූර්ණ බෙලහනත්වය ආදී කරුණු හෝ යම් කොටස් හිමියෙකු ඔහුගේ කොටස් වෙනත් අයෙකුට පැවරීම හේතු කොට ගෙන එවන් සිදුවීමක් සමාගමේ අඛණ්ඩ පැවැත්මට බාධාවක් නොවේ.

3) සීමිත වගකීම

සමාගම විසින් බාහිර ණය කරුවන් වෙත ඇති ණය සම්බන්ධයෙන් සමාගමේ කොටස් කරුවන්ගේ පෞද්ගලික ධනය වගකීමට නොබැඳේ.එනම් එලෙස බාහිරයට ඇති ණය සම්බන්ධයෙන් කොටස් කරුවන්ගේ වගකීම, ඔවුන් විසින් යොදන ලද ප්‍රාග්ධනයට සීමා වෙයි. ( මෙය සීමාසහිත සමාගමකට පමණක් අදාල වෙයි )

4) කොටස් නිදහසේ පැවරිය හැකි වීම


සමාගමේ කොටස් හිමියෙකුට තමා සතු කොටස් වෙනත් අයෙකු වෙත පැවරීම සඳහා සෙසු කොටස් හිමියන්ගේ අවසරය අවශ්‍ය නොවේ.

# විවිධ සමාගම් වර්ග

2007 අංක 07 දරණ සමාගම් පනත අනුව ප්‍රධාන සමාගම් වර්ග තුනකි.

- සීමාසහිත සමාගම්
- සීමාරහිත සමාගම්
- ඇපයෙන් සීමිත සමාගම්

සීමාසහිත සමාගම්, සීමාසහිත පුද්ගලික සමාගම් සහ සීමාසහිත අක්වෙරල සමාගම් වශයෙන් පවත්වා ගෙන යා හැකිය.




# සමාගමක් සංස්ථාපනය කිරීම

සමාගමක් සංස්ථාපනය කිරීම සඳහා ඕනෑම පුද්ගලයෙකුට සමාගම් රෙජිස්ට්‍රාර් වරයාගෙන් ඉල්ලීමක් කල හැකිය. ඒ සඳහා පලමුව යෝජිත නාමය සමාගම් රෙජිස්ට්‍රාර් වරයා ලවා අනුමත කරවා ගත යුතුය. පසුව සියලුම කොටස් හිමියන් විසින් අත්සන් කරන ලද නියමිත ආකෘතියෙන් වූ ඉල්ලුම් පතක් , පහත ලේඛණද සමග සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කල යුතුය.

- සමාගමේ නම, දැනට පවතින වෙනත් සමාගමක නමට සමාන නොවන බවට ආරම්භක කොටස් හිමියන් විසින් කරන ලද ප්‍රකාශයක්
- සමාගමේ ආරම්භක කොටස් හිමියන් විසින් අත්සන් කරන ලද සාංගමික ව්‍යවස්ථාවලිය

▪ තමන් අධ්‍යක්ෂක ධූරයෙහි කටයුතු කිරීමට කැමති බවට සහ එම ධූරය දැරීම සඳහා නුසුදුස්සෙකු නොවන බවට සමාගමේ අධ්‍යක්ෂකවරුන් විසින් කරන ලද ප්‍රකාශයක්

▪ සමාගම් ලේකම්වරයා විසින් තමා එම ධූරයෙහි කටයුතු කිරීමට කැමති බවට සහ එම ධූරය දැරීම සඳහා නුසුදුස්සෙකු නොවන බවට සිදු කරන ලද ප්‍රකාශය

▪ සමාගමක් නිසි පරිදි සංස්ථාපනය කිරීමෙන් දින 30 ක් තුල සමාගමේ නම, අංකය, ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය නිශ්චිතව දක්වමින් ප්‍රසිද්ධ නිවේදනයක් නිකුත් කල යුතුය.

## සමාගමක අවම කොටස් හිමියන් සංඛ්‍යාව

2007 අංක 07 දරණ සමාගම් පනත අනුව සීමිත සමාගමක් එක් කොටස් හිමියෙක්ගෙන් වුවද පවත්වා ගෙන යා හැකිය.

## සමාගමක නම පිලිබඳ විධිවිධාන ( සමාගම් පනතේ 06 වන වගන්තිය )

- සමාගමක නම ලෙස, වෙනත් සමාගමකට අනුරූප හෝ සමාන නමක් භාවිතා කල නොහැක
- සමාගමක නාමය, නොමග යවන සුලු එකක් නොවිය යුතුය
- සමාගමේ තත්වය, සමාගමේ නම තුල සම්පූර්ණ වශයෙන් හෝ කෙටි යෙදුමක් මගින් නිරූපනය විය යුතුය.
- අමාත්‍යවරයා විසින් ජාතියේ යහපත සැලකිල්ලට ගෙන දෙනු ලබන අවසරයක් මත හැර
    - ජනාධිපතිවරයා හෝ ජනාධිපති
    - නාගරික හෝ සංස්ථාගත
    - සමූපකාරය හෝ සමිතිය
    - ජාතික, රාජ්‍ය හෝ ශ්‍රී ලංකා හෝ ඊට සමාන වචන ....... සමාගමේ නම ලෙස භාවිතා කල නොහැකිය. තවද 34 වන වගන්තිය යටතේ ලබා ගත් බලපත්‍රයකින් තොරව කිසිදු සමාගමකට වාණිජ මණ්ඩලය යන වචනය සමාගමේ නම තුල භාවිතා කල නොහැකිය.

නිල ලැයිස්තුගත සමාගමක් වන / සෑම සීමාසහිත සමාගමකම } නමේ මුලට "සීමාසහිත" හෝ "සී/ස" ⇒ සහ , සමාගම යන වචනයට පෙර "පොදු" යන වචනය යෙදිය යුතුය.

නිල ලැයිස්තුගත සමාගමක් හැර සෑම සීමාසහිත සමාගමකම } නමේ මුලට “සීමාසහිත” හෝ “සී/ස” ⇒ යන වචනය යෙදිය යුතුය.

සෑම පෞද්ගලික සමාගමකම සෑම සීමාසහිත සමාගමකම } නමේ මුලට “සීමාසහිත” හෝ “සී/ස” ⇒ සහ , සමාගම යන වචනයට පෙර “පෞද්ගලික“ හෝ “පෞද්” යන වචනය යෙදිය යුතුය.

## සමාගමක නම වෙනස් කිරීම

සමාගම් රෙජිස්ටාර්වරයාගේ පූර්ව අනුමැතිය සහිතව සමාගමේ නම වෙනස් කිරීම සඳහා විශේෂ යෝජනා සම්මතයක් සම්මත කර ගැනීම

⇓

එම යෝජනා සම්මතයේ සිට දින 10 ක් තුල එලෙස නම වෙනස් කිරීම පිලිබඳව නියමිත ආකෘතියෙන් සමාගම් රෙජිස්ටාර්වරයා දැනුවත් කිරිම

⇓

එලෙස නම වෙනස් කිරීමෙන් වැඩ කරන දින 20 ක් තුල නම වෙනස් කිරීම පිලිබඳව මහජන දැන්වීමක් පල කිරිම

## සමාගමේ නම සහ අංකය යෙදිම අනිවාර්ය වන ලේඛණ

- සමාගමේ සියලුම ව්‍යාපාරික ලිපි
- සමාගමේ සියලු දැන්වීම් සහ වෙනත් නිල ප්‍රසිද්ධ කිරීම්
- සමාගම වෙනුවෙන් අත්සන් කරනු ලබන සියලු විනිමය බිල්පත්, පොරොන්දු නෝට්ටු, පිටසන්ප කිරීම්, චෙක්පත්, මුදල් ඇණවුම් හෝ භාණ්ඩ
- සමාගමේ සියලු ඉන්වොයිස්, රිසිට්පත් සහ ණයවර ලිපි
- සමාගමේ නිල මුද්‍රාවක් ඇත්නම් එම නිලමුද්‍රාව
- සමාගමේ නෛතික වගකීමක් ඇතිකරනු ලබන වෙනත් ලේඛණ

## සමාගමක ලියාපදිංචි කාර්යාලය

සෑම සමාගමකටම මෙරට තුල ලියාපදිංචි කාර්යාලයක් තිබිය යුතුය. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සමාගම් රෙජිසිටාර් වරයා වෙත නිවේදනයක් කර ඕනෑම අවස්ථාවකදී සමාගමේ ලියාපදිංචි කාර්යාලය වෙනස් කල හැකිය.

## සමාගමක් විසින් පවත්වා ගෙන යා යුත් ව්‍යවස්ථාපිත පොත් සහ රෙජිස්ටර

- මහසභා රැස්වීම් සහ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වල කටයුතු වාර්තා කිරීම සඳහා වන වාර්තා පොත්
- පැමිණීමේ නාමලේඛණ
- කොටස් හිමියන්ගේ අනුක්‍රමික අංක
- කොටස් රෙජිස්ටරය
- අධ්‍යක්ෂක වරුන්ගේ සහ ලේකම් වරුන්ගේ රෙජිස්ටරය
- ගාස්තු පිලිබඳ රෙජිස්ටරය
- සම්බන්ධතා රෙජිස්ටරය

## සාංගමික ව්‍යවස්ථාවලිය

සමාගම් පනතේ 2 වන වගන්තිය ප්‍රකාරවසමාගමක සෑම ව්‍යාපාරයක්ම, කටයුත්තක්ම, කාර්යක්ම සහ සෑම ගනුදෙනුවක්ම සාංගමික ව්‍යවස්ථාවලියට අනුකූල විය යුතුය. සාංගමික ව්‍යවස්ථාවලිය යනු සමාගමේ අරමුණු, සාමාජිකයන්ගේ කාර්යභාරයන් සහ වගකීම් අන්තර්ගත වන ලේඛණයයි.

- සමාගම් පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව සාංගමික ව්‍යවස්ථාවලිය මගින් ප්‍රතිපාදන සැලසිය හැකි කරුණු
- සමාගමේ අරමුණු
- සමාගමේ කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් සහ බැඳීම්
- සමාගමේ පරිපාලනය සහ කලමනාකාරීත්වය
- මීට අමතරව සමාගම් පනත හා නොගැටෙන ඕනෑම කාර්යයක් සම්බන්ධවද එමගින් ප්‍රතිපාදන සැලසිය හැකිය.

## සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් කිරීම

විශේෂ යෝජනා සම්මතයක් මගින්

⇩

සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් කිරීම

⇩

විශේෂ යෝජනා සම්මතයේ දිනයේ සිට දින 10 ක් ඇතුලත සමාගම් රෙජිස්ටාර්වරයා දැනුවත් කිරීම

## සාංගමික ව්‍යවස්ථාවලිය තුල සමාගමේ අරමුණු ඇතුලත් කිරීම

2007 අංක 07 දරණ සමාගම් පනත අනුව සාංගමික ව්‍යවස්ථාවලිය තුල සමාගමේ අරමුණු ඇතුලත් කිරීමට ( හෝ ඇතුලත් නොකිරීමට ) සමාගමකට අභිමතය ඇත. 17 වන වගන්තිය අනුව සමාගමක සාංගමික ව්‍යවස්ථාවලියේ එම සමාගමේ අරමුනු දක්වා ඇත්නම්, එම අරමුණු වලට යටත්ව ව්‍යාපාර කටයුතු සිදු කල යුතුය.

නමුත් එම අරමුණු අභිබවා සමාගම විසින් යම් ගිවිසුමක් බැඳීමක් හෝ දේපල පැවරීමක් සිදු කර ඇත්නම් සමාගම ඉන් වගකීමට බැඳේ. එවන් අවස්ථාවකදී ඊට අනුමැතිය දුන් අධ්‍යක්ෂකවරුන්, ඔවුන්ගේ යුතුකම් උල්ලංඝනය කලා සේ සැලකේ.

සමාගම් පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව, සමාගම සහ කොටස් හිමියන් අතර මෙන්ම කොටස් හිමියන් සහ කොටස් හිමියන් අතර පවතින ගිවිසුමක් ලෙස සාංගමික ව්‍යවස්ථාවලිය සැලකේ.

**<u>Hickman Vs. Romney Mash Sheep Breeders</u>** - මෙහිදී අදාල සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ දක්වා තිබුණේ සමාගම සහ එහි සාමාජිකයන් අතර ඇති වන ආරවුල් විසඳා ගැනීම සඳහා පලමුව බේරුම්කරණය වෙත යොමු විය යුතු බවයි. එහෙත් එලෙස ඇතිවූ ආරවුලකදී කොටස් හිමියෙකු විසින් පලමුව බේරුම්කරණය වෙත නොගොස්, එම ආරවුල සම්බන්ධයෙන් අධිකරණය හමුවේ නඩුවක් පවරන ලදී. මෙහිදී අධිකරණය තීරණය කලේ එම ආරවුල විසඳා ගැනීම සඳහා පලමුව බේරුම්කරණය වෙත යොමු විය යුතු බවයි.

18 වන වගන්තිය ප්‍රකාරව, සාංගමික ව්‍යවස්ථාවලියේ පිටපතක් ඕනෑම කොටස් හිමියෙකු විසින් ඉල්ලා සිටි විටකදී එම ඉල්ලීමේ සිට දින 5 ක් ඇතුලත සමාගම විසින් එම පිටපත අදාල ඉල්ලුම්කරු වෙත ලබා දිය යුතුය.

## සමාගම විසින් ගිවිසුම් වලට එලඹීම

මෙය අවස්ථා තුනක් යටතේ අධ්‍යයනය කෙරේ.

1) ස්වභාවික පුද්ගලයෙකු විසින් නොතාරිස් වරයෙකු ඉදිරියේ ලිඛිතව අත්සන් කල යුතු ගිවිසුමක් සඳහා සමාගම විසින් ගිවිසුමකට එලඹීම

මෙහිදී සමාගමේ නාමය යටතේ අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙක් විසින් හෝ සාංගමික ව්‍යවස්ථාවලියෙන් බලය ලබා දුන් අයෙකු විසින් හෝ සමාගම විසින් ඒ සඳහා බලය ලබා දුන් ඇටෝර්නි බලකරුවෙකු විසින් , නොතාරිස්වරයෙකු ඉදිරියේදි අත්සන් කිරීම මගින් එම ගිවිසුමට එලඹීම සිදු කල යුතුය.

2) ස්වභාවික පුද්ගලයෙකු විසින් ලිඛිතව අත්සන් කල යුතු නොවන ගිවිසුමක් හෝ බැඳීමක් සඳහා සමාගම විසින් ගිවිසුමකට එලඹීම

මෙහිදී සමාගම වෙනුවෙන් යම් ප්‍රකාශිත හෝ අප්‍රකාශිත ( ව්‍යංග ) අධිකාරී බලයක් දරන තැනැත්තෙකු විසින් අත්සන් කිරීම මගින් එම ගිවිසුමට එලඹීම සිදු කල යුතුය.

3) ස්වභාවික පුද්ගලයෙකු විසින් ලිඛිතව අත්සන් කල යුතු නොවන ගිවිසුමක් හෝ බැඳීමක් සඳහා සමාගම විසින් ගිවිසුමකට එලඹීම

මෙහිදී සමාගම වෙනුවෙන් යම් ප්‍රකාශිත හෝ අප්‍රකාශිත ( ව්‍යංග ) අධිකාරී බලයක් දරන තැනැත්තෙකු විසින් අත්සන් කිරීම මගින් හෝ වාචිකව, එම ගිවිසුමට එලඹීම සිදු කල යුතුය.

## සමාගමක අධ්‍යක්ෂකවරුන්

සමාගම් පනතේ 539 වගන්තිය ( අර්ථනිරූපන වගන්තිය ) ප්‍රකාරව, කවර නමකින් හඳුන්වනු ලැබුවේ වුවද යම් තැනැත්තෙකු සමාගමක් තුල පාලනය සහ ඒ සම්බන්ධ කටයුතු ඉටු කරනු ලබන්නේ නම් ඔහු අධ්‍යක්ෂකවරයෙකු ලෙස සැලකේ.

පොදු සමාගමක් සම්බන්ධයෙන් ගත් කල අවම වශයෙන් අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු වත් සිටිය යුතු අතර, පෞද්ගලික සමාගම් සම්බන්ධයෙන් අවම අධ්‍යක්ෂකවරුන්ගේ ප්‍රමාණය එකකි.

## සමාගමක අධ්‍යක්ෂක ධූරයක් දැරීමට නුසුදුසුකම්

- වයස අවුරුදු 18 ට වඩා අඩු වීම
- ස්වභාවික පුද්ගලයන් නොවන තැනැත්තන්
- නිදහස් නොකල වස්තු භංගත්වයට පත්වූ පුද්ගලයන්
- බංකොලොත් තැනැත්තන් ලෙස විනිශ්චය කරන ලද පුද්ගලයන්
- සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියෙහි සඳහන් සුදුසුකම් වලට අනුකූල නොවන තැනැත්තන්

- පැරණි සමාගම් පනත යටතේ ( එනම් 1982 සමාගම් පනත යටතේ ) අධ්‍යක්ෂකවරයෙක් වීමට නුසුදුසු යැයි නම් කල පුද්ගලයෙක්

- සමාගම් පනතේ 213 වගන්තිය යටතේ පහත සඳහන් හේතු මත වසර 05 ක කාලයක් සමාගමක ප්‍රවර්ථකයෙක් හෝ පාලනය කරන්නෙක් වීමට නුසුදුසු යැයි දක්වා ඇති පුද්ගලයෙක්

    - බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් ලැබිය හැකි අපරාධ වරදකට වරදකරු වීම
    - වංක හෝ වංචනික ක්‍රියාවක් සම්බන්ධ වරදකට වරදකරු වීම
    - සිහිවිකල තැනැත්තෙක් බවට අධිකරණය විනිශ්චය කිරීම
    - වස්තු භංගත්වයට පත්වූ අයෙක් බවට අධිකරණය විනිශ්චය කිරීම
    - 214 වන වගන්තියේ විධිවිධාන වලට අනුව අධිකරණය විසින් අධ්‍යක්ෂකවරයෙකු වීමට නුසුදුස්සෙක් ලෙස නම් කල අයෙක්

## <u>අධ්‍යක්ෂකවරුන්ව පත් කිරීම</u>

සමාගම සංස්ථාගත කිරීමේ ඉල්ලීමේ නම් සඳහන් පලමු අධ්‍යක්ෂකවරුන්, පනතේ විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂකවරයෙකු වීම අවසන් වන තෙක්, සමාගමේ අධ්‍යක්ෂකවරුන් ලෙස ක්‍රියා කරනු ලබයි. සාංගමික ව්‍යවස්ථාවලියේ අන්‍යාකාරයකින් විධිවිදාන සලස්වා ඇතිනම් මිස ඒ හැර, පසුව පත් කරනු ලබන අධ්‍යක්ෂකවරුන් සාමාන්‍ය යෝජනා සම්මතයකින් පත් කරනු ලැබිය හැකිය.

## <u>අධ්‍යක්ෂකවරුන්ගේ ධූරය දැරිය හැකි වයස</u>

අවම වයස ⟹ අවුරුදු 18 ( සමාගම් පනතේ 202 වගන්තිය )

පොදු සමාගමක් නොවන සමාගමක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂක ධූරය දැරිය හැකි උපරිම වයස ⟹ උපරිම වයස පිලිබඳ සීමාවක් නැත

පොදු සමාගමක හෝ පොදු සමාගමක පාලිතයක් වන පෞද්ගලික සමාගමක අධ්‍යක්ෂක ධූරය දැරිය හැකි උපරිම වයස ⟹ අවුරුදු 70 යි. ( 210(2) වගන්තිය ) මහසභා රැස්වීමක යෝජනා සම්ම-
- තයක් මගින් අවුරුදු 70 ඉක්මවූ අධ්‍යක්ෂ-
- කවරයෙකුව නැවත ධූරයේ පිහිටුවිය හැක

## අධ්‍යක්ෂකවරුන්ගේ ධූරය හිස්වීම

එය පහත කරුණු මත සිදුවිය හැකිය

- ☞ අධ්‍යක්ෂකවරයා විසින් ධූරයෙන් ඉල්ලා අස් වීම නිසා
- ☞ අධ්‍යක්ෂකවරයාව ධූරයෙන් ඉවත් කිරීම නිසා
- ☞ ධූරයට පත් කරනු ලැබූ පසු සමාගම් පනතේ 202 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වීම
- ☞ අධ්‍යක්ෂකවරයා මිය යාම
- ☞ සමාගම් පනතේ 210 (2) වගන්තිය යටතේ ධූරය හිස් වීම
- ☞ සාංගමික ව්‍යවස්තාවලිය ප්‍රකාරව අන් ආකාරයකින් ධූරය හිස් කිරීම

යම් අධ්‍යක්ෂකවරයෙකුගේ පත්වීම දෝෂ සහගත වුවද එය නොසලකමින් යම් අධ්‍යක්ෂකවරයෙකුගේ ක්‍රියාකාරකම් වලංගු වන්නේය.

## අධ්‍යක්ෂකවරයෙකුගේ බලතල පැවරීම

අධ්‍යක්ෂකවරයෙකු සතු බලතල අධ්‍යක්ෂක මණ්ඩලය විසින් වෙනත් පාර්ශවයන් වෙත පැවරිය හැකි අවස්ථාවන් ඇති අතර එහෙත් එවන් පවරා දෙනු ලැබූ බලතල සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩලය වගකිව යුතුය.

පහත කරුණු සම්බන්ධයෙන් සමාගමක අධ්‍යක්ෂකවරුන්ට තමන් සතු බලතල වෙනත් පාර්ශවයක් වෙත පවරා දිය නොහැකිය.

- කොටස් නිකුතුව
- කොටස් නිකුතුව සඳහා ප්‍රතිශ්ඨාව තීරණය කිරීම
- බෙදා හැරීම
- ප්‍රකාශිත ප්‍රාග්ධනය අවකරණය කිරීම
- සමාගමේ කොටස් මිලට ගැනීම
- සමාගමේ මනාපය නිදහස් කිරීම
- මූල්‍ය ආධාර දීමේ සීමා
- ලියාපදිංචි කාර්යාලය වෙනස් කිරීම
- ඒකාබද්ධ කිරීමේ යෝජනා අත්සන් කිරීම
- අද්මිනිස්ත්‍රාසිකරුවන් පත් කිරීම

## අධ්‍යක්ෂකවරුන්ගේ යුතුකම්

- ❤ සද්භාවයෙන් සහ සමාගමේ යහපත උදෙසා ක්‍රියා කිරීම
- ❤ සමාගම් පනතට සහ සාංගමික ව්‍යවස්ථාවලියට එකඟව ක්‍රියා කිරීම

♥ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම සහ අලස බවෙන් හෝ බරපතල නොසැලකිල්ලෙන් යුතුව ක්‍රියා නොකිරීම ( 189 වගන්තිය )

♥ සාධාරණ අවස්ථා වලදී වෙනත් තැනැත්තන් වෙතින් ලැබෙන තොරතුරු සහ උපදෙස් අනුව ක්‍රියා කිරීම සහ එම තොරතුරු සහ උපදෙස් භාවිතා කිරීම

♥ සම්බන්ධතා හෙලිදරව් කිරීම

♥ සමාගමේ තොරතුරු භාවිතා නොකිරීම

♥ කොටස් ගනුදෙනු හෙලිරරව් කිරීම

♥ 216 වන වගන්තියේ විධිවිධාන දක්වා ඇති ආකාරයට පමණක් අධ්‍යක්ෂකවරුන්ගේ පාරිශ්‍රමික සහ වෙනත් ප්‍රතිලාභ අනුමත කිරීම

♥ 217 වන වගන්තිය යටතේ අවසර දී ඇත්නම් මිස අධ්‍යක්ෂකවරුන් සඳහා ණය ලබා නොදීම හෝ ඇප හෝ ඇපකර ලබා නොදිම

♥ සමාගම බංකොලොත් වන අවස්ථාවකදී 219 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට ක්‍රියා කිරීම

♥ ප්‍රාග්ධනය බරපතල ලෙස අඩුවන බව පෙනී යන්නේ නම් අතිවිශේෂ මහසභා රැස්වීමක් කැඳවීම

**<u>Dorchester finance Co Vs Stebbing</u>** නඩුවේදි අධිකරණය තීරණය කලේ සමාගමක අධ්‍යක්ෂකවරයෙකු විසින් සකස් හිස් චෙක් පතකට අත්සන් කිරීම, "අධ්‍යක්ෂකවරයෙකු විසින් නිසි උද්යෝගයෙන් සහ සාධාරණ සැලකිල්ලෙන් යුතුව ක්‍රියා කල යුතුය" යන යුතුකම කඩ කිරීමක් වන බවයි.

## සමාගම් ආරවුල් මණ්ඩලය

සමාගම් සම්බන්ධ ආරවුල් විසඳා ගැනීම සඳහා විකල්ප ආරවුල් විසඳීමේ ක්‍රමවේදයක් ලෙස 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සමාගම් ආරවුල් මණ්ඩලය පිහිටුවා ඇති අතර, එය විෂය භාර අමාත්‍ය වරයා විසින් පත් කරනු ලබයි.

## සමාගමක් ගණන් බේරා වසා දැමීම

මෙය ආකාර කිහිපයකට සිදු විය හැකි අතර සමාගමක් ගණන් බේරා වසා දැමීම මගින් සමාගමේ අවසානය සිදු වේ.

සමාගම් පනතේ 271 වගන්තියට අනුව රු. ලක්ෂ 05 කට වඩා වැඩි මුදලක් සමාගම වෙතින් අය විය යුතු ණය හිමියෙකුට එම ණය මුදල ඉල්ලා සති තුනක් ඇතුලත මුදල් ගෙවීමට සමාගම අපොහොසත්

වන අවස්ථාවකදී එම සමාගම ගණන් බේරා වසා දමන ලෙසට වූ ඉල්ලීමක් අධිකරණය වෙතින් සිදු කල හැකිය.

සමාගමේ සාමාජිකයන් හෝ ණය දීමනාකරුවන් විසින් අධිකරණයේ මැදිහත්වීමකින් තොරව සාමාන්‍ය හෝ විශේෂ යෝජනා සම්මතයක් මගින් සමාගම ගණන් බේරා වසා දැමීම ස්වේච්ඡා ඈවර කිරීමේදී සිදුවේ.

අධිකරණයේ අධීක්ෂණයට යටත්ව ඇවර කිරීම සිදු කිරීමේදි සමාගමේ සාමාජිකයන් විසින් සම්මත කරනු ලබන ඈවර කිරීම පිලිබඳ යෝජනා සම්මතයක් මගින් එය සිදු කරනු ලබන අතර, අධිකරණය විසින් ඈවර කිරීමේ කාර්යය පටිපාටිය පමණක් අධීක්ෂණය කරනු ලබයි. යම් යම් සහනයන් ඉල්ලීමේ නිදහස ණය දීමනාකරුවන් සහ වෙනත් තැනැත්තන් හට ඇත. දැනටමත් පත් කර ඇති ඈවර කරුවන්ට අමතරව අධිකරණය විසින් ඈවර කරුවන් පත්කිරීම හෝ ඉවත් කිරීම මෙහිදී සිදු විය හැකිය.